

# 7 අර්ථවත් මෙහෙවරකට යොමුව

ශු. මතෙව් 10:5-15

ජේසුස් වහන්සේ තම මෙහෙවර වඩාත් ශක්තිමත් ව ව්‍යාප්ත කිරීම උදෙසා ශ්‍රාවකයන් අතරින් දෙළොස් දෙනෙකු තෝරා ගත් සේක. ජේසුස් වහන්සේගේ සුබාරංචිය ජනතාව වෙත ගෙන යෑම හෙවත් "ධර්ම දූත සේවය" ඔවුන්ගෙන් අපේක්ෂිත ප්‍රධාන මෙහෙවර විය. තම මුල් ගෝලයන් හෙවත් ප්‍රේරිතයන් ධර්මදූත මෙහෙවර උදෙසා යොමු කිරීමේ දී අවධාරණය කරනු ලැබූ කාරණා හඳුනා ගනිමින් ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් වන අපහට ද එමගින් ලද හැකි ආදර්ශ විමසා බලමු.

ජේසුස් වහන්සේගේ සුබාරංචිය ජනතාව වෙත ගෙන යෑම ධර්මදූත සේවය යනුවෙන් අදහස් වේ. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන්ට ධර්මදූත සේවාව සඳහා උන්වහන්සේ වෙතින් මනා මග පෙන්වීමක් ලද ආකාරය සුබාරංචි ග්‍රන්ථ හැදෑරීමේ දී අපට පැහැදිලි වේ. සුබාරංචිය දේශනා කිරීම, රෝගීන් සුව කිරීම, යක්ෂාත්ම දුරු කිරීම සහ මළවුන් නැගිටුවීම වැනි ජේසුස් වහන්සේගේ ක්‍රියාකාරීත්වයන් මගින් ඔවුන් අත්දැකීම් ලබා ගත් බව නිසැක ය. එම අත්දැකීම්වලින් පෝෂණය ලද ශ්‍රාවකයන් දොළොස් දෙනා ධර්මදූත කාර්යභාරය සඳහා පිටත් ව ගියෝ ය.

## ධර්මදූත මෙහෙවරෙහි යොමුව (ශු. මතෙව් 10:5-6)

ප්‍රථමයෙන් ධර්මදූත මෙහෙවර යොමුකරනු ලැබූයේ විජාතිකයන්ට හෝ සමාරිතයන්ට නොව ඉශ්‍රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙත ය. එසේ කරනු ලැබූයේ ඔවුන්ගේ එඬේර නායකයන්ගෙන් එම කාර්යභාරය ඉටු නොවූ නිසා බව ජේසුස් වහන්සේ පැවසූ සේක (ශු. මතෙව් 10:6). ජේසුස් වහන්සේ හා ශ්‍රාවකයන් දොළොස් දෙනා විසින් පළමු ව ඉශ්‍රායෙල්වරුනට සුබාරංචිය දේශනා කිරීමත්, ඔවුන් සුබාරංචිය අසා ක්‍රිස්තුස් වහන්සේ පිළිගෙන ගැලවීම ලබාගැනීම තුළින් පොළොවේ සියලු ජාතීන්ට ඔවුන් මගින් එම ආශීර්වාදය ව්‍යාප්ත කරවීමත් දේව අභිප්‍රාය වූ බව පැහැදිලි ය.

## ධර්මදූත මෙහෙවරෙහි ප්‍රධාන පණිවුඩය (ශු. මතෙව් 10:7)

ස්වර්ග රාජ්‍ය ළං වී ඇති බව ප්‍රකාශ කරමින් ස්වර්ග රාජ්‍යය වෙත ජනතාව යොමු කිරීම මෙහි දී ශ්‍රාවකයන්ට භාර විය. ඒ උදෙසා මනස්තාපනය වෙමින් ස්වර්ග රාජ්‍යයේ වටිනාකම් අවබෝධ කරගැනීමට ජනතාව යොමු කිරීම ශ්‍රාවකයන්ගේ වගකීම විය. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් යොමු කළේ මෙම මෙහෙවර උදෙසා ය.

## ධර්මදූත මෙහෙවරට අදාළ විශේෂ කාර්යයන් (ශු. මතෙව් 10:8)

ලාදුරු රෝගීන් ඇතුළු රෝගීන් සුව කිරීමට, යක්ෂාත්ම දුරු කිරීමට හා මළවුන් නැගිටවනු ලැබීමට ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙතින් බලය ලැබූහ (ශු. මතෙව් 10:1). ජේසුස් වහන්සේ ඒ සඳහා දේව අනුග්‍රහය, දයා කරුණාව මෙන් ම බලය ද ඔවුන්ට දෙනු ලැබූ සේක. ධර්මදූත සේවාව මගින් ජේසුස් වහන්සේ ඔවුන්ගෙන් බලාපොරොත්තු වූයේ ඔවුන් ලද එම දේව අනුග්‍රහය හා බලය, මනුෂ්‍යයාගේ යහපත වෙනුවෙන් කැප කිරීම ය. මිනිසාට සුව සහනය, නිදහස හා ජීවනය ලබා දීම ජේසුස් වහන්සේගේ මෙහෙවරෙහි මෙන් ම, ශ්‍රාවකයන්ගේ ධර්මදූත සේවාවෙහි ද ප්‍රධාන කාර්යභාරයක් විය.

## ධර්මදූත සේවයට උපදෙස් (ශු. මතෙව් 10:9-10)

ධර්මදූත සේවය සඳහා පිටත් ව යාමේ දී රන් රිදී හෝ තඹ කාසි හෝ ගමන් මල්ලක්වත් කමිස දෙකක්වත් පාවහන් සඟලක්වත් හෝ සැරයටියක්වත් රැගෙන නොයන ලෙස ශ්‍රාවකයෝ උපදෙස් ලැබූහ. ශ්‍රාවකයන්ගේ ධර්මදූත සේවය ලබන පාර්ශ්ව විසින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරනු ලැබිය යුතු බව ජේසුස් වහන්සේ අවධාරණය කළ සේක. තවද ධර්මදූත මෙහෙවරේ දී ලෞකික අවශ්‍යතා මත නොරැඳී සම්පූර්ණ වශයෙන් දෙවියන් වහන්සේ මත යැපීමට මඟපෙන්වීමක් ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට ලබා දුන් සේක. සරල, චාම්, සාමාන්‍ය දිවි පැවැත්මක් තුළින් ජීවිතාදර්ශයෙන් සුබාරංචිය ප්‍රකාශ කිරීමේ වැදගත්කම ජේසුස් වහන්සේ මෙහි දී අවධාරණය කළ සේක.

## ධර්මදූත සේවයේ භාරදූර බව (ශු. මතෙව් 10:11-15)

දේව රාජ්‍යයේ පණිවුඩය නොපිළිගන්නා හා ඔවුන්ට ආගන්තුක සත්කාර නොකරන අය සම්බන්ධයෙන් ද ජේසුස් වහන්සේ අවධාරණය කළ සේක. එවැනි අයට සාමය අහිමි වන අතර, පාදවල දූවිලි ගසා දැමීමෙන් සංකේතවත් වනුයේ පැමිණෙන දේව විනිශ්චය යි. දේව පුත්‍රයාණන් ප්‍රතික්ෂේප කරන අයගේ විපාක සොදොම් ගොමෝරා නිදසුන මගින් උන්වහන්සේ පැහැදිලි කළ සේක.

මෙලෙස ශ්‍රාවකයන් දොළොස් දෙනා ජේසුස් වහන්සේගේ ධර්මදූත මෙහෙවර ව්‍යාප්ත කළ අයුරින් අපි සැම හැකි උපරිම අයුරින් අප ඇසුරු කරන සමාජය තුළත් අප ජීවත් වන ලෝකය තුළත් ධර්මදූත මෙහෙවරෙහි යෙදෙන්නට අදිටන් කර ගනිමු.

**ක්‍රියාකාරකම**

1. ඔබට ධර්මදූතයකු ලෙස සේවය කළ හැකි අවස්ථා 5ක් නම් කරන්න.
2. ධර්මදූත සේවයේ දී අනුගමනය කළ යුතු මඟපෙන්වීම් මාලාවක් පිළියෙල කරන්න.
3. මෑත කාලීන ධර්මදූතවරයෙකුගේ ජීවිත කතාවක් සොයා ඔබේ වචනයෙන් ලියන්න.